# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1643/20 - 2010 මාර්තු 02 වැනි අඟහරුවාදා - 2010.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ

ප්‍රකාශනය

(40 වන අධිකාරය වූ ) මහජන ආරක්ෂක ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන, 2010 මාර්තු මස දෙවන දින සිට ක්‍රියාත්මක වූ බව ප්‍රකාශ කරමින් ( මෙහි මින්මතු “ හදිසි අවස්ථා ප්‍රකාශනය” යනුවෙන් සඳහන් කරනු ලබන ) ප්‍රකාශනයක්, ඒ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබ ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව අනුව, හදිසි අවස්ථා ප්‍රකාශනය කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුතු යයි නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඒ ප්‍රකාශනය නිකුත් කරනු ලැබූ දිනයේ දී පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබ තිබෙන හෙයින් ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාවේ (i) වන අනුඡේදය මගින් නියම කරනු ලැබ ඇති පරිදි දින දහයක් තුළ දී පාර්ලිමේන්තුව රැස්වීම සඳහා ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබිය යුතු හෙයින් ද ;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ (i) වන අනුඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, හදිසි අවස්ථා ප්‍රකාශනයක් සාදන ලද බව පාර්ලිමේන්තුවට දන්වා සිටීමට හා ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම පිණිස 2010 මාර්තු මස නව වන දින පෙරවරු 9.30ට පාර්ලිමේන්තුව රැස්වීම පිණිස මේ ප්‍රකාශනය මගින් කැඳවා සිටිමි.

වර්ෂ දෙදහස් දහයක් වූ, මාර්තු මස දෙවන දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

03-647


1A - G 12548— 930 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.